සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education – Western Province

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2019
First Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ගණිතය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 03 යි. |

- ❖ **A කොටසින් ප්‍රශ්න 5 ක් ද B කොටසින් ප්‍රශ්න 5 ක් ද තෝරාගෙන ප්‍රශ්න දහයකට පිළිතුරු සපයන්න.**
- ❖ **එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 100 ක් හිමි වේ.**

## A කොටස

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

**01. (a)** පාවහන් නිෂ්පාදකයෙක් පාවහන් යුගලක් නිෂ්පාදනය කිරීම සඳහා රුපියල් 900 ක් වැය කරයි. නිෂ්පාදකයා එම පාවහන් යුගල 20% ක ලාභ ප්‍රතිශතයක් සහිතව වෙළෙන්දෙකුට විකුණයි.

**(i)** වෙළෙන්දා පාවහන් යුගල මිලදී ගැනීමට වැය කරන මුදල කොපමණද?

**(ii)** වෙළෙන්දා 25% ක ලාභ ප්‍රතිශතයක් තබාගෙන එය පාරිභෝගිකයාට විකුණයි නම් පාරිභෝගිකයා එය මිල දී ගැනීමට වැය කරන මුදල කොපමණද?

**(iii)** වඩා වැඩි ලාභයක් ලබන්නේ නිෂ්පාදකයා ද වෙළෙන්දා ද යන්න හේතු සහිතව ලියා දක්වන්න.

**(b)** රුපියල් 60 000 ට විකිණීමට මිල ලකුණු කර ඇති ශීතකරණයක් අත්පිට මුදලට විකිණීමේදී 12% ක වට්ටමක් ලබාදෙනු ලැබේ.

**(i)** ශීතකරණය මිලදී ගැනීමේදී ලැබෙන වට්ටම කොපමණද?

**(ii)** එහි විකුණුම් මිල සොයන්න.

**02.** $y = 3x - 2$ ශ්‍රිතයේ ප්‍රස්තාරය ඇඳීමට සැකසූ අසම්පූර්ණ අගය වගුවක් පහත දැක්වේ.

| $x$ | $-2$ | $-1$ | $0$ | $1$ | $2$ |
|---|---|---|---|---|---|
| y | $-8$ | .......... | $-2$ | .......... | $4$ |

**(i)** වගුවේ හිස්තැන් පුරවන්න.

**(ii)** ඉහත ශ්‍රිතයේ ප්‍රස්තාරය ඇඳ දක්වන්න.

**(iii)** $y = 7$ වන විට $x$ හි අගය සොයන්න.

**(iv)** ඉහත ඛණ්ඩාංක තලයේම $y = 3x + 1$ ශ්‍රිතයේ ප්‍රස්තාරය අඳින්න.

**(v)** ඉහත ශ්‍රිතවල ප්‍රස්තාර පිළිබඳව ඔබට කුමක් කිව හැකිද?

**03.** **(a)** **(i)** සුළු කරන්න. $(2a + b)(a - b)$

**(ii)** සාධක සොයන්න. $2a^2 - 8$

**(iii)** මෙම වීජීය ප්‍රකාශනවල කුඩා පොදු ගුණාකාරය සොයන්න.

$3(x - y), (x^2 - y^2)$

**(b)** **(i)** සමචතුරස්‍රාකාර පිට්ටනියක පැත්තක දිග මීටර $(x + 5)$ නම් පිට්ටනියේ වර්ගඵලය $x$ ඇසුරෙන් සොයන්න.

**(ii)** $x = 5$ නම් පිට්ටනියේ වර්ගඵලය සොයන්න.

**04.** **(a)** විශාල ප්‍රමාණයේ පළතුරු යුෂ බෝතලයක ධාරිතාව $2.5\ l$ වේ. උත්සව අවස්ථාවක දී මෙම පළතුරු යුෂ වලින් සංග්‍රහ කිරීමේ දී වීදුරුවකට $250\ ml$ ක ප්‍රමාණයක් බීම වත් කරනු ලබයි. උත්සව අවස්ථාවට 325 දෙනෙකු සහභාගී වේ නම් ඔවුන්ට සංග්‍රහ කිරීමට අවශ්‍යවන විශාල ප්‍රමාණයේ අවම පළතුරු යුෂ බෝතල් ගණන සොයන්න.

**(b)** සමචතුරස්‍ර හැඩැති පතුලක් සහිත භාජනයක පතුලේ වර්ගඵලය $360\ cm^2$ වේ. එහි ජලය $7.2\ l$ ක් පුරවා තිබේ නම් භාජනයේ උස සොයන්න.

**05.** **(a)** පහත දී ඇති සරල සමීකරණ විසඳන්න.

$$\frac{a + 2}{3} = 4$$

$$3x - 1 = 9 - 2x$$

**(b)** අඹගෙඩි දෙකක් සහ දොඩම් ගෙඩියක් මිලදී ගැනීමට රුපියල් 100 ක් වැය වේ. අඹ ගෙඩියක් හා දොඩම් ගෙඩියක් මිලදී ගැනීමට රුපියල් 70 ක් වැය වෙයි. අඹ ගෙඩියක මිල රුපියල් $x$ ද දොඩම් ගෙඩියක මිල රුපියල් $y$ ද ලෙස ගෙන සමගාමී සමීකරණ යුගලයක් ලියා විසඳීමෙන් අඹ ගෙඩියක හා දොඩම් ගෙඩියක මිල වෙන වෙනම සොයන්න.

**06.** කෙසෙල් කැන් 100 ක ඇති කෙසෙල් ගෙඩි ගණන පිළිබඳ තොරතුරු ඇතුලත් අසම්පූර්ණ වගුවක් පහත දැක් වේ.

| **කෙසෙල් කැනක ඇති ගෙඩි ගණන** | **කෙසෙල් කැන් ගණන ($f$)** | **මධ්‍ය අගය ($x$)** | **$fx$** |
|---|---|---|---|
| 50 – 60 | 20 | | |
| 60 – 70 | 25 | | |
| 70 – 80 | 30 | | |
| 80 – 90 | 15 | | |
| 90 – 100 | 10 | | |

**(i)** මෙම ව්‍යාප්තියේ මාත පන්තිය කුමක්ද?

**(ii)** ඉහත වගුව උත්තර පත්‍රයට පිටපත් කරගෙන $x$ හා $fx$ තීර සම්පූර්ණකර කෙසෙල් කැනක ඇති මධ්‍යන්‍ය ගෙඩි ගණන සොයන්න.

**(iii)** කෙසෙල් ගෙඩියක් රුපියල් 8 බැගින් විකුණුවේ නම් කෙසෙල් කැන් 100 ක් විකිණීමෙන් ලැබෙන ආදායම රුපියල් 58 000 නොඉක්මවන බව හේතු සහිතව පෙන්වන්න.

## B කොටස

**ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

**07.** එක්තරා උත්සව අවස්ථාවක් සඳහා විදුලි බුබුලු වලින් සැකසූ සැරසිල්ලක වෘත්තාකාර වළලු ලෙස විදුලි බුබුලු සවිකර තිබූ ආකාරය රූපයේ දැක් වේ.



**(i)** කුඩාම වළල්ලේ සිට වළලු හතරක ඇති විදුලි බුබුලු ගණන ආරෝහණ පිළිවෙලට ලියා දක්වන්න.

**(ii)** n වන වළල්ලේ ඇති විදුලි බුබුලු ගණන සඳහා n ඇසුරෙන් ප්‍රකාශනයක් ලියන්න.

**(iii)** ඒ ඇසුරෙන් 15 වන වළල්ලේ ඇති විදුලි බුබුලු ගණන සොයන්න.

**(iv)** ඉහත සැරසිල්ලේ විදුලි බුබුලු 62 ක් ඇත්තේ කී වෙනි වළල්ලේ ද?

**(v)** $(n - 1)$ වන වළල්ලේ ඇති විදුලි බුබුලු ගණන $2n$ බව පෙන්වන්න.

**08.** cm / mm පරිමාණය සහිත, සරල දාරයක්, කවකටුවක් හා පැන්සලක් පමණක් භාවිතාකර නිර්මාණ රේඛා පැහැදිලිව දක්වමින්,

**(i)** $PQ = 7$ cm ද $Q\hat{P}R = 60^{\circ}$ ද $PR = 6.5$ cm ද වන සේ PQR ත්‍රිකෝණය නිර්මාණය කරන්න.

**(ii)** QR හි දිග මැන ලියන්න.

**(iii)** PQ හි ලම්බ සමච්ඡේදකය නිර්මාණය කරන්න.

**(iv)** $Q\hat{P}R$ හි කෝණ සම්ඡේදකය නිර්මාණයකර ඉහත ලම්බ සමච්ඡේදකය සමග ඡේදනය වන ලක්ෂ්‍යය O ලෙස නම් කරන්න.

**(v)** O කේන්ද්‍රය ද OP අරය ද වන සේ වෘත්තයක් නිර්මාණය කරන්න.

**09.** එකම තරමේ හා එකම වර්ගයේ අංක 1 සිට 8 තෙක් අංක ලියා රෝල් කර ඇති කඩදාසි තුණ්ඩු දැමූ පෙට්ටියකින් අහඹු ලෙස තුණ්ඩුවක් ඉවතට ගනු ලැබේ.

**(i)** ලැබිය හැකි සියළු ප්‍රතිඵල ඇතුලත් නියැදි අවකාශය ලියා දක්වන්න.

**(ii)** ඉවතට ගන්නා ලද තුණ්ඩුවේ සටහන් කර ඇති සංඛ්‍යාව ඔත්තේ සංඛ්‍යාවක් වීමේ සම්භාවිතාව සොයන්න.

**(iii)** ඉවතට ගන්නා ලද තුණ්ඩුවේ සටහන් කර ඇති සංඛ්‍යාව ප්‍රථමක සංඛ්‍යාවක් නොවීමේ සම්භාවිතාව සොයන්න.

**(iv)** ඉවතට ගන්නා ලද තුණ්ඩුවේ සටහන් සංඛ්‍යාව ඉරට්ට සංඛ්‍යාවක් හෝ වර්ග සංඛ්‍යාවක් වීමේ සම්භාවිතාව සොයන්න.

**(v)** පළමුව ගන්නා ලද තුණ්ඩුව ඔත්තේ සංඛ්‍යාවක් නොවූයේ නම් නැවත එම තුණ්ඩුව පෙට්ටියට නොදමා ආපසු තුණ්ඩුවක් ගත් විට එය ඔත්තේ සංඛ්‍යාවක් වීමේ සම්භාවිතාව සොයන්න.

**10.** **(a)** දිගංශය මැනීම සඳහා භාවිතා කරන උපකරණය නම් කර එහි දළ රූපයක් අඳින්න.

**(b)** A නම් ලක්ෂ්‍යයක සිට උතුරු දිශාවට විහිදී ඇති පාරක පිහිටි Q නම් ලක්ෂ්‍යයට නැගෙනහිරින් පිහිටා ඇති P නම් ස්ථානයේ ඇති ගසක් A සිට බැලූ විට $030^{o}$ ක දිගංශයකින් ද A ට 10 m ක් දුරින් පිහිටි B නම් ලක්ෂ්‍යයක සිට බැලූ විට අංශක $060^{o}$ දිගංශයකින්ද පෙනේ.




1 cm කින් 2 m දැක්වෙන පරිමාණයට ඉහත තොරතුරු රූප සටහනක් මගින් දක්වා P සිට බලන විට A හි දිගංශයත් P සිට Q ට ඇති දුරත් ගණනය කරන්න.

**11.** දී ඇති රූපයේ AB = AC වන අතර AC සහ PR රේඛා සමාන්තර ද AB සහ QR රේඛා සමාන්තර ද වේ.




**(i)** PQR ත්‍රිකෝණය සමද්විපාද ත්‍රිකෝණයක් බව සාධනය කරන්න.

**(ii)** PB = QC නම් ABC සහ PQR ත්‍රිකෝණ අංග සම වන බව පෙන්වා PQ = 7 cm ද PR = 5 cm ද වන විට ABC ත්‍රිකෝණයේ පරිමිතිය ගණනය කරන්න.

**12.** රූපයේ දැක්වෙන්නේ O කේන්ද්‍රය වූ වෘත්තයකි. $O\hat{A}C = x$ වේ.




**(a)** හේතු දක්වමින් පහත දැක්වෙන කෝණවල විශාලත්වය $x$ ඇසුරෙන් සොයන්න.

**(i)** $A\hat{C}O$

**(ii)** $B\hat{O}C$

**(iii)** $O\hat{B}C$

**(b)** $A\hat{C}B$ හි අගය අංශක කීයද?

**(c)** AC = 12 cm ද BC = 9 cm ද නම් AB හි දිග කොපමණද?